**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2018**

------------------------------------------------------------------------------------------------------------------

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍යයක් විසින්ම එම අස්තිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්තිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද 2003 ජූනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---------------------

**2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවීම් වවුචර්වල අදාළ වටිනාකම හා කාර්යභාරය තහවුරු කරන බිල්පත්, රිසිට්පත්, තොග සහතික ආදි ලියවිලි ගෙවීම තහවුරු කිරීමට සාක්ෂි ලෙසට වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 17 කදී ගෙවන ලද එකතුව රු.1,239,907 ක ගෙවීම් වවුචර්වලට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකර ගෙවීම් කර තිබුණි. | අරමුදලෙන් කරනු ලබන සියලුම ගෙවීම් සඳහා නියමිත පරිදි වවුචර් පිළියෙළ කර අවශ්‍ය ලිඛිත ඇමුණුම් සමඟ ඉදිරිපත් කර ඇති බව. | ගෙවීම් වවුචර් සමඟ ඊට අදාළ තහවුරු කිරීමේ මූලාශ්‍ර ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| i. | මුදල් රෙගුලාසි 137 | මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව ගෙවීම් අනුමත නොකර වවුචර් 14 කින් රු.1,862,369 ක් ගෙවා තිබුණි. | සියලු ගෙවීම් චෙක්පත් මඟින් සිදු කරන අතර යම් ප්‍රමාද දෝෂයක් හේතුවෙන් එම ගෙවීම් අනුමත කිරීම/ නිර්දේශ කිරීම අතපසු වී ඇති බවත් හා එවන් අතපසු වීම් නැවත සිදු නොවීමට අවශ්‍ය සියලු පියවර මේ වන විට ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් අනුමත කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 138 හා 257 | සහතික කළ වවුචර් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී වවුචර් 138 ක් සහතික නොකර රු.22,935,154 ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් වවුචර්පත්වල දෝෂයක් තිබූ නමුත් කරන ලද සියලුම වියදම් භාරකාර මණ්ඩලයේ සාමූහික අනුමැතිය මත සිදුකර අනුමත කළ බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 177 (1) හා (3) | දෛනික මුදල් ලැබීම් අප්‍රමාදව බැංකු ගත කළ යුතු වුවද ලැබී තිබුණු රු.192,965 ක ප්‍රවේශපත්‍ර හා බදු කුලී ආදායම් බැංකු ගත කිරීමකින් තොරව වියදම් කර තිබුණි. | 2018 වර්ෂයේ සංකීර්ණය තුළ සංවර්ධන ව්‍යාපෘති රැසක් සිදු කරන ලද අතර යම් යම් අවස්ථාවලදී ඇති වූ හදිසි අවශ්‍යතාවයන්ට මුදල් වැය කිරීමට සිදු වූ බව හා එම වැය කිරීම් ගරු සභාපතිතුමාගේ අනුමැතිය මත සිදු කිරීමට බලය පවරා තිබූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අම්බුළුවාව ජෛව විවිධත්ව භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වන වගන්තියේ "අ" සිට "ත"දක්වා වූ අරමුණු 20 අතරින් පුද්ගලයින්ගේ ක්‍රීඩා සහ විනෝද කටයුතු පිළිබඳ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම, ගොවියන් ධෛර්යමත් කිරීම සහ ප්‍රජාව තුළ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම, අම්බුළුවාව කඳුපෙළ වටා ප්‍රදේශය වැඩි දියුණු කිරීම හා බුද්ධිමත්ව, බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල ආයෝජනයන් කිරීමට තැනැත්තන් උනන්දුකරවීම යන අරමුණු ඉටු කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | අරමුදලට ලැබෙන ආදායම් උපයෝගී කර ගනිමින් සංකීර්ණය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් යොදා ගනිමින් ඔවුනට සාධාරණ වැටුපක් ගෙවීම මත ඔවුන්ගේ පැවැත්ම සඳහා උපකාරී වීම, ජීවන තත්ත්වය උසස් කර ගැනීමට සහය වීම, ඉදිරි කාර්යයන් සඳහා විවිධ අංශයන් පිළිබඳ පුහුණු ශ්‍රමිකයන් පිරිසක් ඇති කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීම, සාමාජීය හා ආර්ථික ක්‍රියාකාරකම් තුළ යහපත් සහයෝගීතාවයන් ඇති කිරීම යනාදී කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති බව. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අම්බුළුවාව අරමුදල සතුව පවතින රු.5,400,000 ක පුස්තකාල ගොඩනැගිල්ල හා රු.2,500,000 ක සංචාරක බංගලාවක් සහ වටිනාකම විගණනයට ඉදිරිපත් නොකළ රංග ශාලාව සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාර අරමුදල පවත්වාගෙන යාමට අදාළ මුදල් ප්‍රතිපත්තියේ වියදම් ප්‍රතිපත්ති අනුව රු.200,000 කට වැඩි වියදම් සඳහා සීමිත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 ක දී රු.1,287,525 ක භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වියදම් දැරීමේදී කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | භාරකාර මණ්ඩලයේ පූර්ව හා පසුකාලීන අනුමැතිය මත සිදු කර ඇති බව. | මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදාලව පිළියෙල කර ඇති මුදල් ප්‍රතිපත්ති වලට අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාර අරමුදලට අයිතිය නොමැති වාහනයක් ධාවනයේ යොදවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී එම වාහනය වෙනුවෙන් රු.105,532 ක අලුත්වැඩියා වියදමක් දරා තිබුණි. | අරමුදල සතු වාහන තුනක් සඳහා අවශ්‍ය හිමිකම්පත් (ලියාපදිංචි සහතික) සහ අනෙකුත් තොරතුරු අඩංගු ලිපි ගොනු පවත්වාගෙන යාම සිදු කර තිබුණි | අරමුදල සතු වාහන සඳහා පමණක් අළුත්වැඩියා වියදම් දැරිය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(1) ඡේදය ප්‍රකාරව භාර අරමුදල සඳහා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර එය භාරකාරීත්ව මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත කරවා ගෙන ඊට අනුකූල ලෙස අයවැය පාලනය කරමින් අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කළ යුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි. | පසු වර්ෂයන් සඳහා අය වැය ලේඛණයේ සකස් කිරීම තුළ මෙම අවශ්‍යතාවය මග හරවා ගැනීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |